

# අරමුණු, කාර්යයන් සහ සංවිධානය

ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව

# අරමුණු, කාර්යයන් සහ සංවිධානය

ජනවාරි 2019

**ISBN:** 978 955 575 384 - 5

**ලිපිනය:**

ශ්‍රී ලංකා මහ බැංකුව

නො. 30, ජනාධිපති මාවත

කොළඹ 1

ශ්‍රී ලංකා

**දුරකථන:**

+94-11-2477000

**වෙබ් අඩවිය:**

https://www.cbsl.gov.lk

# පටුන


පිටුව

**1. ශ්‍රී ලංකා මහ බැංකුව** **1**

**2. අරමුණු** **1**

මිල ස්ථායිතාව 2

මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව 2

**3. මුදල් මණ්ඩලය** **3**

**4. කාර්යයන්** **4**

මුදල් ප්‍රතිපත්තිය 5

මුදල් ප්‍රතිපත්ති උපකරණ 6

විනිමය අනුපාතික ප්‍රතිපත්තිය 7

විදේශ සංචිත කළමනාකරණය 8

සාර්ව විචක්ෂණතා අධ්‍යයනය 8

සුලභ වශයෙන් භාවිත කරනු ලබන සාර්ව විචක්ෂණශීලී උපකරණ 10

බැංකු, මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය 11

පියවීමේ පහසුකම් සැපයීම සහ ගෙවීම් පද්ධතිය නියාමනය 13

මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම 14

රජයේ බැංකුකරු සහ මූල්‍ය උපදේශක 14

වාණිජ බැංකුවල බැංකුකරු 15

රාජ්‍ය ණය කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍ය නියෝජිත 15

සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය සහ එහි භාරකරු ලෙස ක්‍රියා කිරීම 16

විදේශ විනිමය කළමනාකරණය 17

මූල්‍ය අන්තර්ගතභාවය සහ තුලිත වර්ධනය උදෙසා කටයුතු කිරීම 17

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීම, හඳුනා ගැනීම, පරීක්ෂා කිරීම හා නීතිය හමුවට ගෙන ඒම සඳහා මූල්‍ය බුද්ධි සේවා සැපයීම 16

**5. සංවිධානය** **19**

කමිටු 19

දෙපාර්තමේන්තු 19

ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු 20

**6. මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන පුවත්පත් නිවේදන** **25**

**7. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රකාශන** **25**

**8. ප්‍රාදේශීය කාර්යාල** **26**

ප්‍රාදේශීය කාර්යාල මගින් ආවරණය කරන දිස්ත්‍රික්ක 26

ප්‍රාදේශීය කාර්යාලවල ඇමතුම් විස්තර 27

# 1. ශ්‍රී ලංකා මහ බැංකුව

ව්‍යවහාර මුදල් කොමසාරිස් මණ්ඩලය විසින් වෙන් කරන ලද ප්‍රාග්ධනය යොදා ගෙන 1949 වසරේ මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවන ලද අතර එහි මෙහෙයුම් කටයුතු 1950 අගෝස්තු 28 වැනි දින ආරම්භ කෙරිණි. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රීය ස්ථානය හොබවන ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රුපියලේ අගය මෙන් ම රටේ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමේ වගකීම ද දරයි.

# 2. අරමුණු

මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන් එහි ආරම්භයේ සිට වෙනස් වන ආර්ථික වාතාවරණයට අනුව විකාශනය වී ඇත. මහ බැංකු කටයුතුවල සිදු වන ප්‍රවණතාවලට අනුකූල ව 2002 වසරේ දී මුදල් නීති පනත සංශෝධනය කිරීමෙන් මහ බැංකුව තම ප්‍රධාන අරමුණු විධිමත් කළ අතර ඒ අනුව එහි ප්‍රධාන අරමුණු දෙකකි. එනම්,

- ආර්ථික සහ මිල ස්ථායිතාව සහ
- මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය කිරීම දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව ඉහත සඳහන් අරමුණු ද්විත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කරයි.

2002 වසරේ දී මුදල් නීති පනත සංශෝධනය කිරීමට පෙර, දේශීය මුදලේ අගය ස්ථාවර කිරීම, විනිමය අනුපාතික ස්ථායිතාව සුරැකීම, නිෂ්පාදනය, සේවා නියුක්තිය හා මූර්ත ආදායම ඉහළ මට්ටමකට ප්‍රවර්ධනය කිරීම මෙන් ම ඵලදායී සම්පත් පූර්ණ වශයෙන් සංවර්ධනය කිරීම සඳහා දිරි දීම හා ප්‍රවර්ධනය කිරීම වැනි බහුවිධ අරමුණු මහ බැංකුව වෙත පැවරී තිබුණි. ඇතැම් විට, මෙම බහුවිධ අරමුණු ගැටෙනසුලු හෝ නො ගැළපෙනසුලු විය. මේ වන විට, මහ බැංකුවක මූලික අරමුණු විය යුත්තේ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම බවට ජාත්‍යන්තර ව එකඟත්වයක් ඇති විය. මිල ස්ථායිතාව ස්ථාවර සාර්ව ආර්ථික තත්ත්ව මත තීරණාත්මක ලෙස රඳා පවතින හෙයින් 'ආර්ථික හා මිල ස්ථායිතාව' මහ බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් ලෙස නිශ්චය කරන ලදි.

තව ද, ආර්ථික ස්ථායිතාව පවත්වා ගෙන යෑම සඳහා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තීරණාත්මක සාධකයක් බව අත්දැකීම් අනුව පෙනී ගොස් ඇත. එම නිසා, මහ බැංකුවේ මූලික අරමුණක් ලෙස මූල්‍ය පද්ධති ස්ථායිතාව ද හඳුනා ගෙන ඇත. මෙම අරමුණු ද්විත්වය එකිනෙකට සහසම්බන්ධිත සහ අනුපූරක වේ. මූල්‍ය අතරමැදියන් (ආයතන) හරහා මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය කරනු ලබන හෙයින් මිල ස්ථායිතාව සඳහා මූල්‍ය පද්ධති ස්ථායිතාව තහවුරු කිරීම අතිශයින් වැදගත් වේ. මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවෙහිලා

මිල ස්ථායිතාව වැදගත් වන්නේ මූල්‍ය ආයතනවල අවදානම් ව්‍යුහයන් කෙරෙහි බලපෑම් ඇති කරවමින් පොදු මිල මට්ටමට ප්‍රතිචාරාත්මක ව පොලී අනුපාතික, විනිමය අනුපාතික සහ අනෙකුත් වත්කම් මිල ගණන් හැසිරෙන බැවිනි. තිරසාර ආර්ථික වර්ධනයට ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව අවශ්‍ය වේ. එම නිසා, මෙම අරමුණු ද්විත්වය එකිනෙක හා සමායෝජනය වන අතර ඒ මගින් මහ බැංකුවට තම ප්‍රධාන කටයුතු එලදායී අන්දමින් ඉටු කිරීමට හැකි වේ. සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ස්වාධීන ව කටයුතු කිරීමට විශාල ඉඩකඩක් මහ බැංකුවට සලසා දී ඇත. මෙහි දී ප්‍රතිපත්ති තීරණ ගැනීමෙහිලා, මහ බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ සමීප සබඳතාවකින් කටයුතු කරන අතර මුදල් අමාත්‍යාංශයේ ලේකම් මහ බැංකුවේ පාලනාධිකාරිය වන මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි.

## මිල ස්ථායිතාව

දේශීය මුදල් ඒකක මෙන් ම වෙනත් මුදල් ඒකක යොදා ගනිමින් මිල දී ගන්නා භාණ්ඩ හා සේවාවල වටිනාකම සුරක්ෂිත කරලීම මිල ස්ථායිතාව මගින් සිදු වේ. මිල ස්ථායිතාව නැතහොත් ස්ථායී මිල ගණන් යන්නෙන් අදහස් කරනුයේ අඩු සහ ස්ථාවර උද්ධමනයක් පවතින බවයි. උද්ධමනය අඩු මට්ටමක පවතින අතර ඉදිරියේ ද උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැ යි අපේක්ෂා කරන්නේ නම් ආර්ථික ක්‍රියාකාරකම් හොඳින් සිදු වන බව අත්දැකීම් මගින් පෙනී ගොස් ඇත. මෙ වැනි තත්ත්වයක් යටතේ පොලී අනුපාතික ද පහළ මට්ටමක පවතී. එ බඳු වාතාවරණයක් යටතේ ආර්ථිකයට සිය උපරිම වර්ධන ධාරිතාව අත්පත් කර ගැනීමටත් ඉහළ සේවා නියුක්තියක් ඇති කර ගැනීමටත් අවකාශ සැලසේ. එ සේ වන්නේ ඉහළ සහ නිතර වෙනස්වන සුලු උද්ධමන තත්ත්වයකින් ඇති විය හැකි අහිතකර බලපෑම්වලින් තොර ව පාරිභෝගිකයින් මෙන් ම නිෂ්පාදකයින් ද විශ්වාසයකින් යුතු ව ආර්ථික තීරණ ගනු ලබන නිසාවෙනි. එම නිසා, අඩු හා ස්ථාවර උද්ධමනය නැතහොත් මිල ස්ථායිතාව, ආර්ථික ක්‍රියාකාරකම්වල සහ සේවා නියුක්තියේ තිරසාර දිගුකාලීන වර්ධනයක් ඇති කිරීමට ඉවහල් වෙයි. උද්ධමනය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය උපයෝගී කර ගනියි.

## මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව

මූල්‍ය පද්ධතියක අඩංගු වන සංඝටක තුනකි: මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ සහ මූල්‍ය යටිතල පහසුකම් වශයෙනි. මූල්‍ය පද්ධතියක ප්‍රධාන කාර්යයන් වන්නේ සම්පත් බෙදා වෙන් කිරීම, අවදානම් කළමනාකරණය සහ ගෙවීම් පියවීමයි. ස්ථාවර මූල්‍ය පද්ධතියක් බාධාවකින් තොර ව ආර්ථික කටයුතු කර ගෙන යෑමට මග සලසයි. තව ද, ස්ථාවර මූල්‍ය පද්ධතියක් තැන්පත්කරුවන්ට සහ අයෝජකයින්ට හිතකර වාතාවරණයක් බිහි කරයි. එම නිසා, ස්ථාවර මූල්‍ය පද්ධතියක් කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණය දිරිමත් කරන අතර ආයෝජනය සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කරයි.

# 3. මුදල් මණ්ඩලය

## පාලන අධිකාරිය

ශ්‍රී ලංකා මහ බැංකුවට එයට ම ආවේණික වූ නීතිමය ව්‍යුහයක් ඇත. සියලු ම බලතල, කාර්යයන් සහ රාජකාරී කටයුතු පැවරී ඇති මුදල් මණ්ඩලයට එහි සංස්ථාපිත වගකීම පැවරී ඇත. ප්‍රතිපත්ති තීරණ ගැනීම මෙන් ම මහ බැංකුව කළමනාකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම ද පාලන අධිකාරිය ලෙස මුදල් මණ්ඩලයට පැවරෙන වගකීම් වෙයි.

මහ බැංකුවේ මුදල් මණ්ඩලය සාමාජිකයින් පස් දෙනෙකුගෙන් (5) සමන්විත වෙයි.

- මහ බැංකු අධිපති
- මුදල් අමාත්‍යාංශයේ ලේකම් (නිල බලයෙන්)
- විධායක නො වන සාමාජිකයින් තිදෙනෙක්.

මහ බැංකු අධිපති මුදල් මණ්ඩලයේ සභාපති වන අතර, මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද කටයුතු කරයි. මහ බැංකු අධිපති සහ විධායක නො වන මුදල් මණ්ඩල සාමාජිකයින් මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරනු ලබයි. මහ බැංකු අධිපතිගේ සහ විධායක නො වන මුදල් මණ්ඩල සාමාජිකයින්ගේ නිල කාලය අවුරුදු හය (6) කි. මුදල් මණ්ඩල රැස්වීම් ගණපූරණය සඳහා සාමාජිකයින් තිදෙනෙකු සිටිය යුතු වේ. මුදල් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ වලංගු වීම සඳහා සාමාජිකයින් තිදෙනෙකුගේ අනුමැතිය අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ඒකමතික තීරණයක් ගැනීමට අවශ්‍ය අවස්ථාවල දී සාමාජිකයින් පස් දෙනාගේ ම අනුමැතිය ඒ සඳහා ලැබිය යුතු වේ.

මුදල් ඇමැතිවරයා සහ මුදල් මණ්ඩලය අතර මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ ව එකිනෙකට වෙනස් මතයක් පැවතියහොත්, රජයේ මතයට අනුකූල ව මුදල් මණ්ඩලය ගන්නා ප්‍රතිපත්ති සඳහා රජය වගකීම භාර ගන්නා බව මුදල් ඇමතිවරයා විසින් මුදල් මණ්ඩලයට දන්වා රජයේ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලෙස මුදල් මණ්ඩලයට නියම කළ හැකි යි.

මුදල් මණ්ඩලය විසින් පත් කරන ලද විධායක නො වන මුදල් මණ්ඩල සාමාජිකයෙක් සභාපතිත්වය දරන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවක් ඇත. සෙසු සාමාජිකයින් දෙදෙනා මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රවීණතාවක් ඇති මහ බැංකු සේවකයින් නො වන දෙදෙනෙකු විය යුතු ය. මහ බැංකුවේ මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා කිරීමේ පිළිවෙත්, අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණවත් බව හා සඵලතාව මෙන් ම අභ්‍යන්තර විගණන හා බාහිර කටයුතුවල විෂයපථය හා ප්‍රතිඵල පිළිබඳ ව විගණන කමිටුව විමර්ශනය කොට මුදල් මණ්ඩලයට උපදෙස් ලබා දෙයි.

# 4. කාර්යයන්

## ප්‍රධාන කාර්යයන්

(අ) මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම

(ආ) විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම

(ඇ) ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීම

(ඈ) සාර්ව විචක්ෂණතා ආවේක්ෂණය කිරීම

(ඉ) මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන්, මුදල් තැරැව්කරුවන්, සීමිත වෙළෙඳුන් (මුදල් හුවමාරු කරන්නන්) වැනි බැංකු සහ බැංකු නො වන මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම

(ඊ) පියවීම් පද්ධතිය නියාමනය කිරීම සහ පියවීමේ පහසුකම් සපයා දීම

(උ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ බෙදා හැරීම

(ඌ) ආර්ථික දත්ත හා සංඛ්‍යාන සම්පාදනය කිරීම සහ ව්‍යාප්ත කිරීම

(එ) රජයේ බැංකුකරු හා මූල්‍ය උපදේශක ලෙස කටයුතු කිරීම

(ඒ) වාණිජ බැංකුවල බැංකුකරු ලෙස කටයුතු කිරීම

## නියෝජිත කාර්යයන්

(අ) රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සහ රජයේ මූල්‍ය නියෝජිතයා ලෙස කටයුතු කිරීම

(ආ) සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම සහ එහි භාරකරු ලෙස කටයුතු කිරීම

(ඇ) විදේශ විනිමය කළමනාකරණය කිරීම

(ඈ) මූල්‍ය අන්තර්ගතභාවය සහ තුලිත වර්ධනය සඳහා පහසුකම් සැලසීම

## මුදල් ප්‍රතිපත්තිය

දේශීය ආර්ථිකයේ මිල ස්ථායිතාව අත් කර ගැනීම සඳහා මහ බැංකුව තම මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවයි. මූලික වශයෙන් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන්නේ මුදලේ පිරිවැයට සහ පවතින මුදල් ප්‍රමාණයට බලපෑම් කිරීමෙනි. එම නිසා මහ බැංකුව, මුදල් ප්‍රතිපත්ති උපකරණ කිහිපයක් උපයෝගී කර ගනිමින් ආර්ථිකයේ වෙළෙඳපොළ පොලී අනුපාතික සහ ණය සැපයුම හසුරුවයි. මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එහි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය වේ.

මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික තීරණය කරනු ලබන්නේ වාණිජ බැංකු සහ අනෙකුත් 'සහභාගීත්ව ආයතන' (දැනට රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් මෙන් ම සේවක අර්ථසාධක අරමුදල) සමග වන තම ගනුදෙනු සඳහා වන අතර මෙම අනුපාතික වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතනයන්හි ණයකරුවන් සහ තැන්පතුකරුවන් සඳහා බල පැවැත්වෙන පොලී අනුපාතිකවල සමස්ත පරාසයට ම බලපායි. අනතුරු ව මෙම පොලී අනුපාතිකවල වෙනස්වීම් ආර්ථිකය තුළ වියදම් කිරීම, ආයෝජනය කිරීම සහ නිමැවුම් තීරණ සඳහා ද අවසානයේ දී නිෂ්පාදන පිරිවැය සහ භාණ්ඩ හා සේවා මිල ගණන් සඳහා ද බලපායි.

උදාහරණයක් ලෙස, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකවල යම් වෙනසක් ඇති වුවහොත් එය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික කෙරෙහි ක්ෂණික බලපෑමක් ඇති කිරීමට හේතු වේ. ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතිකවල ඇති වන වෙනස්වීම් ඉතා කෙටි කාලයක් තුළ දී භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික සහ වාණිජ බැංකු තම ප්‍රමුඛ ගනුදෙනුකරුවන් සඳහා ණය දීමේ දී අය කරනු ලබන පොලී අනුපාතික වැනි වෙනත් නම්‍ය කෙටි කාලීන අනුපාතිකවල ද වෙනස්කම් ඇති කරයි. මෙම වෙනස්වීම් වාණිජ බැංකුවල සාමාන්‍ය ණය දීමේ දී අය කරනු ලබන පොලී අනුපාතික, මැදි කාලීන රජයේ සුරැකුම්පත්වල (භාණ්ඩාගාර බැඳුම්කරවල) එලදා අනුපාතික සහ බැංකු විසින් තැන්පතු සඳහා දෙනු ලබන පොලී අනුපාතික කෙරෙහි ද කිසියම් කාල පමාවක් සහිත ව බලපෑම් ඇති කරයි. ආයතන (ආයෝජනය සඳහා) සහ පාරිභෝගිකයින් (පරිභෝජන වියදම් සඳහා) ඉල්ලුම් කරන ණය කෙරෙහි වෙළෙඳපොළ පොලී අනුපාතිකවල වෙනස්වීම් බලපෑම් ඇති කරවන බැවින් වාණිජ බැංකු මගින් දෙනු ලබන ණය මට්ටම්වලට බලපෑමක් ඇති වීම මෙහි ඊළඟ පියවරයි. මෙම ක්‍රියාවලියේ අවසන් පියවර වන්නේ පොලී අනුපාතික සහ ණය සැපයුමට ඇති වන වෙනස්වීම් හේතුවෙන් සමස්ත ඉල්ලුම කෙරෙහි ද එයින් මිල සහ නිමැවුම කෙරෙහි ද බලපෑම් ඇති වීමයි. අපේක්ෂිත අනුපාතිකයට වඩා අනාගත උද්ධමනය ඉහළ යන්නේ යැයි බලාපොරොත්තු වන්නේ නම්, උද්ධමනය අඩු කිරීමට මහ බැංකුව තම ප්‍රතිපත්ති පොලී අනුපාතික (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) ක්‍රමයෙන් ඉහළ දමයි. ඒ මෙන් ම, අනගත උද්ධමනය දරා ගත හැකි මට්ටමට වඩා අඩු වේ යැයි බලාපොරොත්තු වන්නේ නම් ආර්ථිකය දිරි ගැන්වීම සඳහා මහ බැංකුව තම ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දමයි.

ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පැත්තෙන් බලන විට, මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) තීරණය කරනුයේ ආර්ථිකයේ ධාරිතාව සමග ආර්ථිකයේ ඉල්ලුම එක් තලයක පවතින බව තහවුරු කිරීමට ය. පොලී අනුපාතික වඩා පහළ මට්ටමක පවතී නම් ඉල්ලුම, සැපයුම ඉක්මවා යෑමෙන් උද්ධමනකාරී පීඩනයක් ඇති වී උද්ධමනය වේගවත් විය හැකි ය. පොලී අනුපාතික අනවශ්‍ය ලෙස ඉහළ නම් උද්ධමන වේගය ද අඩු වී නිමැවුම ද අනවශ්‍ය ලෙස පහළ යා හැකි ය.

## මුදල් ප්‍රතිපත්ති උපකරණ

(අ) ප්‍රතිපත්ති පොලී අනුපාතිකඃ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව නිර්මාණය කෙරෙන අතර එමගින් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතික සඳහා ඉහළ සහ පහළ සීමා ද නිර්මාණය වනු ඇතැ යි බලාපොරොත්තු වෙයි. වාණිජ බැංකු, රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල වැනි සහභාගීත්ව ආයතනවලින් මහ බැංකුව දෛනික පදනම මත තැන්පතු භාර ගනියි. දැනට මහ බැංකුව ඒ සඳහා පොලී ගෙවන්නේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේයි. දෛනික පදනම මත නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ සහභාගීත්ව ආයතනවලට මහ බැංකුව ණය ලබා දෙන අතර එහි දී මහ බැංකුවට ඇප (භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර) ලබා දිය යුතු ය. සහභාගීත්ව ආයතනවලට මෙම නිත්‍ය පහසුකම් තම අභිමතය පරිදි භාවිත කළ හැකි ය.

(ආ) විවට වෙළෙඳපොළ කටයුතුඃ දෛනික, වාරික හෝ ස්ථාවර පදනමක් මත මුදල් වෙළෙඳපොළට ද්‍රවශීලතාව නිකුත් කිරීමට හෝ මුදල් වෙළෙඳපොළෙන් ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමට මහ බැංකුව විසින් විවට වෙළෙඳපොළ කටයුතු සිදු කරනු ලබයි. විවට වෙළෙඳපොළ කටයුතු සඳහා භාවිත කරන උපකරණ වන්නේ ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් (මේ සඳහා ණය සුරැකුම් ලෙස භාවිත කළ හැක්කේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වන රජයේ සුරැකුම්පත් ය), රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත මිල දී ගැනීම්, රජයේ සුරැකුම්පත් ස්ථාවර පදනම මත විකුණුම්, මහ බැංකු සුරැකුම්පත් විකුණුම්, මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම් සහ විදේශ විනිමය හුවමාරුයි. නිත්‍ය පොලී අනුපාත කොරිඩෝවේ පරාසය තුළ විවට වෙළෙඳපොළ කටයුතු සිදු වේ යැ යි මහ බැංකුව බලාපොරොත්තු වෙයි. මහ බැංකුවේ අභිමතය පරිදි විවට වෙළෙඳපොළ කටයුතු සිදු කරන අතර මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතා තත්ත්වයන්ට බලපෑම් කිරීම එහි අරමුණයි. දැනට පවතින මුදල් ප්‍රතිපත්තියට සරිලන ලෙස ප්‍රතිපත්ති පොලී කොරිඩෝව තුළ එක් මට්ටමක බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ස්ථාවර කිරීමට මහ බැංකුව එමගින් බලාපොරොත්තු වෙයි.

(ඇ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය: වාණිජ බැංකු සතු රුපියල්වලින් පවත්වා ගෙන යනු ලබන ඉල්ලුම් තැන්පතු, ඉතුරුම් තැන්පතු සහ කාලීන තැන්පතුවලින් මහ බැංකුවේ පවත්වා ගෙන යා යුතු අවම සංචිත ප්‍රතිශතය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය මගින් නියම කරයි. මූල්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ණය ක්‍රම මගින් මවන මුදල් ධාරිතාව සීමා කිරීමට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පනවා ඇත.

(ඈ) බැංකු අනුපාතිකය: මෙය ද්‍රවශීලතා අපහසුතා ඇති වාණිජ බැංකුවලට මහ බැංකුව ණය ලබා දීමේ දී අය කරනු ලබන පොලී අනුපාතිකයයි. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට වඩා බැංකු අනුපාතිකය වැඩි අතර එය දඬ පොලී අනුපාතිකයකි.

(ඉ) විදේශ විනිමය කටයුතු: මහ බැංකුව විදේශීය ව්‍යවහාර මුදල් මිල දී ගන්නා විට එය රුපියල් ද්‍රවශීලතාව සැපයීම වැඩි කරයි. එ ලෙස ම විදේශීය ව්‍යවහාර මුදල් විකුණන විට රුපියල් ද්‍රවශීලතාව පහළ යයි. ඒ අනුව, රුපියල් ද්‍රවශීලතාවට බලපෑම් කිරීම සඳහා අනාගතයේ දිනක දී යම් ව්‍යවහාර මුදලක් නැවත මිල දී ගැනීමේ/විකිණීමේ පොරොන්දුව මත විදේශ ව්‍යවහාර මුදල් මිල දී ගැනීම්/විකිණීම් සිදු කිරීමට විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට ද මහ බැංකුවට ප්‍රවේශ විය හැකි ය.

(ඊ) ණය මත ප්‍රමාණාත්මක සීමා කිරීම්: බැංකුවල ණය වර්ධනය කිරීම කෙරෙහි මහ බැංකුවට සීමා පැනවිය හැකි ය. කෙසේ වුව ද, මෙ වැනි සීමා කිරීම් මහ බැංකුව සාමාන්‍යයෙන් භාවිත නො කරයි.

(උ) ශිෂ්ට ප්‍රයෝග: සන්නිවේදනය යනු මහ බැංකුවට අයත් අමතර උපකරණයකි. එය ඵලදායී ලෙස භාවිත කළ හොත් ආර්ථිකයක එක් එක් පාර්ශ්වයන්ගේ බලාපොරොත්තුවලට බලපෑම් ඇති කළ හැකි වන බැවින් එ මගින් විවිධ වත්කම් මිල ගණන් කෙරෙහි බලපෑම් කළ හැකි වන අතර ඒ තුළින් උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි ය.

## විනිමය අනුපාතික ප්‍රතිපත්තිය

දැනට ක්‍රියාත්මක වන්නේ පාවෙන විනිමය අනුපාතික ප්‍රතිපත්තියකි. ඒ අනුව, ආර්ථිකයේ සාර්ව ආර්ථික ප්‍රවණතා වෙළෙඳපොළේ ඉල්ලුම් සහ සැපයුම් බලවේග මගින් විනිමය අනුපාතිකය තීරණය වේ. විදේශ විනිමය කටයුතුවලට මහ බැංකුව ප්‍රධාන වශයෙන් මැදිහත් වන්නේ විනිමය අනුපාතිකය අධික ලෙස උච්චාවචනය වීම වැළැක්වීම සහ විදේශ සංචිත සතුටුදායක මට්ටමක පවත්වා ගෙන යෑම සඳහා ය. මහ බැංකුව විදේශ විනිමය මිල දී ගැනීම් සහ විකිණීම් සිදු කරනුයේ වෙළෙඳපොළ අනුපාතිකයටයි.

## විදේශ සංචිත කළමනාකරණය

රටේ නිල විදේශ සංචිත කළමනාකරණය කරන්නේ මහ බැංකුවයි. රුපියලේ ජාත්‍යන්තර වටිනාකමේ ස්ථාවරත්වය රැකෙන පරිදි සහ ජංගම ගිණුම යටතට ගැනෙන ජාත්‍යන්තර ගනුදෙනු නිදහසේ සිදු වීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් විදේශ විනිමය සංචිතයක් සහ කුඩා රන් සංචිතයක් පවත්වා ගෙන යා යුතු බවට මුදල් නීති පනතින් නිර්දේශ කරයි.

රටේ වත්කම්වල ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ අතර උචිත තුළනයක් පැවතෙන ආකාරයෙන් විදේශ විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය කරනු ලබයි. විදේශ සංචිතවලින් විශාල කොටසක් ස්ථිර ආදායම් සුරැකුම්පත්වල (විදේශීය රාජ්‍ය සුරැකුම්පත්) ද අනෙක් කොටස විදේශීය ස්ථාවර තැන්පතු, ඒක්ෂණ සහ ජංගම ගිණුම් මෙන් ම රන්වල ද ආයෝජනය කෙරෙයි. මේ වන විට, සංචිත ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර්වලින් ද ඊට අමතර ව යුරෝ, ජපන් යෙන්, ඕස්ට්‍රේලියානු ඩොලර්, චීන යුවාන් සහ නවසීලන්ත ඩොලර් වැනි අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්වලින් ද පවත්වා ගෙන යයි. විදේශ සංචිත කළඹෙහි සංයුතිය තීරණය කිරීමේ දී ණය සේවා ගෙවීම්, ද්‍රවශීල අවශ්‍යතා සහ ව්‍යවහාර මුදල්වලින් ආදායම් උත්පාදනයට ඇති හැකියාව පිළිබඳ ව ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනී.

## සාර්ව විචක්ෂණතා අධ්‍යයනය

මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගෙන යෑම මහ බැංකුවේ වගකීමක් බැවින් මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතිය නිරන්තරයෙන් ආවේක්ෂණයට හා නියාමනයට ලක් කරනු ලබයි. මීට හේතු වන්නේ මූල්‍ය පද්ධතිය හා ආර්ථිකය අතර පවතින සමීප සබඳතාවත් ඒ හේතුවෙන් මූල්‍ය පද්ධතියේ ඇති අවදානම් මූල්‍ය අර්බුදයක් ලෙස පැතිර ගියහොත් ඉන් ආර්ථික අර්බුදයක් ඇති වීමට ඇති හැකියාවත් ය. පද්ධති අවදානම යනු සමස්ත මූල්‍ය පද්ධතියේ කඩා වැටීමකට හෝ බිඳ වැටීමකට හේතු විය හැකි අවදානමයි. එක් ආයතනයක් හෝ සමූහයක් සම්බන්ධයෙන් පවතින අවදානම මුළු මූල්‍ය පද්ධතියට ම අවදානමක් ඇති නො වන පරිදි මැඩ පවත්වා ගත හැකි වේ නම් එ මගින් මූල්‍ය පද්ධතිය කෙරෙහි අවදානමක් ඇති නො වේ. සාර්ව විචක්ෂණතා නියාමනය පද්ධති අවදානම අවම කිරීම සඳහා වන අතර, ක්ෂුද්‍ර විචක්ෂණතා නියාමනය මූල්‍ය පද්ධතියට අයත් තනි හෝ සමූහ ආයතනවල අවදානම අවම කිරීම සඳහා වේ. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ ක්ෂුද්‍ර විචක්ෂණතා නියාමනය අතර හිඩැස සාර්ව විචක්ෂණතා නියාමනය විසින් පුරවනු ලබයි.

මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වයට බලපාන බාධාවන් විශාල වශයෙන් පැතිරී යෑම හෝ මූල්‍ය පද්ධතිය කඩා වැටීම ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බරපතල ලෙස හානි සිදු කරනු ඇත. එම නිසා මූල්‍ය පද්ධතිය තුළ අධික ලෙස අවදානම් ගැනීම වැළැක්වීම සාර්ව විචක්ෂණතා ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණයි. මූල්‍ය පද්ධති අවදානමට කාල දෘෂ්ටිකෝණයක් හෝ හරස්කඩ දෘෂ්ටිකෝණයක් තිබිය හැකි ය.

(අ) කාල දෘෂ්ඨිකෝණයකින් සලකා බලා සාදන ලද සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති කාලයත් සමග වර්ධනය වන මූල්‍ය පද්ධතියේ අවදානම් මර්ධනය කිරීම සඳහා යොදවනු ලබයි. මූල්‍ය චක්‍ර සහ කාලයත් සමග වර්ධනය වන මූල්‍ය පද්ධතියේ අවදානම්වලට හේතු වනුයේ මූල්‍ය පද්ධතිය හා ආර්ථිකය අතර පවතින අන්තර් සබඳතා ය. මූල්‍ය බලවේග මගින් ආර්ථිකයේ ප්‍රසාරණයන් මෙන් ම ඒවා පෝෂණය කිරීම ද සිදු විය හැකි ය. මෙ වැනි ප්‍රසාරණයන් සමග ම අවදානම් ගැනීම් දිගින් දිගට ම ඉහළ ගියහොත් ණය මෙන් ම වත්කම් මිල ගණන් ඔරොත්තු දිය නො හැකි මට්ටම් කරා ඉහළ යෑමෙන් මූල්‍ය අර්බුද ඇති විය හැකි ය. මේ සම්බන්ධයෙන් ණය අවදානම් ලෙස ඉහළ ගොස් අර්බුදකාරී තත්ත්වයන් ඇති වූ ප්‍රාග්ධන වෙළෙඳපොළවලට දැක්විය හැකි හොඳ ම උදාහරණ වන්නේ කොටස් වෙළෙඳපොළ, ඉඩම් සහ නිවාස සඳහා වෙළෙඳපොළ මෙන් ම රන් සඳහා වෙළෙඳපොළයි. එම නිසා, ඉහත දක්වා ඇති ආකාරයේ ප්‍රසාරණාත්මක කාල පරිච්ඡේදයක දී මූල්‍ය පද්ධතිය විසින් අවශ්‍ය කරන ප්‍රාග්ධනය මෙන් ම ද්‍රවශීලතාව ගොඩ නගා ගත යුතු යි. එ වැනි ප්‍රාග්ධන හා ද්‍රවශීලතා ස්වාරක්ෂක ගොඩ නගා ගැනීමෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ මිල ගණන් ඉහළ යෑම දරා ගත හැකි මට්ටම්වලට සීමා කෙරෙන අතර, එ මගින් ආර්ථික පසුබෑස්මක් ඇති වුවහොත් එ වැනි පසුබෑස්මක් දරා ගැනීමට ද උපකාරී වේ. මේ අනුව කාල දෘෂ්ඨිකෝණයකින් පද්ධති අවදානම මුල් කොට ගෙන සැකසෙන විචක්ෂණශීලී ප්‍රතිපත්ති හා උපකරණ අධික ලෙස ණය ප්‍රසාරණය වීම වැළැක්වීමට හා මූල්‍ය චක්‍ර කෙරෙහි ප්‍රතිවිරුද්ධ බලවේගයක් ලෙස ක්‍රියා කිරීමට උපකාරී වේ.

(ආ) මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ සහ මූල්‍ය යටිතල පහසුකම් අතර ඇති අන්‍යෝන්‍ය සබඳතා, අන්‍යෝන්‍ය රැඳියාව මෙන් ම ඒවායේ පොදු අවදානම්වලට ලක්වීමට ඇති ඉඩකඩ හේතුවෙන් මූල්‍ය පද්ධතිය ඔස්සේ අවදානම් පැතිර යෑමට ඇති නැඹුරුව සැලකිල්ලට ගෙන සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති සාදනු ලබන්නේ හරස්කඩ දෘෂ්ඨිකෝණයක් යොදා ගනිමිනි. අන්‍යෝන්‍ය සබඳතා හේතුවෙන් එක් ආයතනයක් අඩපණ වීම මගින් අනෙකුත් ආයතනවලට බලපෑමක් ඇති කළ හැකි අතර එය පැතිරීමෙන් සමස්ත මූල්‍ය පද්ධතිය ම කඩා වැටිය හැකි ය. මෙ වැනි ප්‍රතිපත්තිමය උපකරණ බොහොමයක් නිර්මාණය කර ඇත්තේ ඇතැම් පාර්ශ්වයක් හෝ පාර්ශ්වයන් සමූහයන් මුහුණ පාන අවදානම් තත්ත්වය උග්‍ර වුවහොත් ඉන් මූල්‍ය පද්ධතියට ඇති අවදානම සීමා කිරීමට ය. තව ද, මූල්‍ය අතරමැදිකරුවන් අතර පවතින අන්‍යෝන්‍ය සබඳතා තක්සේරු කිරීමට යොදා ගත හැකි ආකෘති ද බොහොමයක් ගොඩනගා ඇත.

සාර්ව විචක්ෂණතා ප්‍රතිපත්ති අධීක්ෂණ රාමුව යටතේ ප්‍රමාණාත්මක තාක්ෂණික ක්‍රම කිහිපයක් උපයෝගී කර ගෙන මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තක්සේරු කරනු ලැබේ. මූල්‍ය පද්ධතියට ඇති විය හැකි අවදානම් නිරීක්ෂණය කරනුයේ සාර්ව විචක්ෂණ දර්ශක කිහිපයක් හරහා යි. ගෝලීය ආර්ථිකය සහ දේශීය ආර්ථිකය මෙන් ම දේශීය ආර්ථිකයේ ඇතැම් අංශ එ නම්, මූර්ත අංශය, මූල්‍ය වෙළෙඳපොළ (මුදල්, බැඳුම්කර,

විදේශ විනිමය සහ කොටස් වෙළෙඳපොළ), ඉඩම් සහ නිවාස/ගොඩනැගිලි සඳහා වෙළෙඳපොළ, ඇතැම් වෙළෙඳ භාණ්ඩ සඳහා වෙළෙඳපොළ, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, සහ ව්‍යාපාරික අංශය වැනි අංශ විකාශනය වන ආකාරය අනුව මූල්‍ය පද්ධතියට ඇති වන බලපෑම ඇගැයීමට මෙම දර්ශක භාවිත කරයි. මූල්‍ය පද්ධතියේ අවදානම්වලට මුහුණ දීමේ හැකියාව තක්සේරු කිරීමට සහ ගොඩනැගෙන අවදානම් හඳුනා ගැනීමට මූල්‍ය ස්ථායිතා දර්ශකය, සාර්ව ආර්ථික ස්ථායිතා දර්ශකය, මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතා දර්ශකය සහ බැංකු අංශයේ ශක්තිමත්භාවය ඇගැයීමේ දර්ශකය වැනි සංයුක්ත දර්ශක කිහිපයක් භාවිත කරයි. එයට අමතර ව, මූල්‍ය ආයතන අතර අන්‍යෝන්‍ය සබඳතා සහ අවදානම් ඒකරාශීවීම් හඳුනා ගන්නේ ජාල විශ්ලේෂණය උපයෝගී කර ගනිමිනි. මූල්‍ය ආයතනවල ශක්තිමත්භාවය ඇගැයීමට ආතති පරීක්ෂාවන් භාවිත කරයි. රුපියල් විනිමය අනුපාතිකයේ හැසිරීම හේතුවෙන් මූල්‍ය පද්ධතියට ඇති වන අවදානම් සහ පීඩන හඳුනා ගැනීමට පූර්ව දැනුම් දීමේ දර්ශක ක්‍රමයක් නිමවා ඇත.

### සුලභ වශයෙන් භාවිත කරනු ලබන සාර්ව විචක්ෂණශීලී උපකරණ

- ණය ප්‍රමාණය සහ සුරැකුම් වටිනාකම අතර අනුපාතය මත කාලානුකූල ඉහළ සීමා (LTV)
- කාලානුකූල අවම ආන්තික අවශ්‍යතා
- පරිණත කාල නො ගැලපීම් මත සීමා
- විදේශ විනිමය ණය මත ඉහළ සීමා
- ශුද්ධ විවෘත විනිමය තත්ත්ව හෝ නො ගැලපීම් මත සීමා
- ප්‍රතිචක්‍රාකාර ප්‍රාග්ධන අවශ්‍යතා
- පද්ධතියට වැදගත් වන මූල්‍ය ආයතන සඳහා අමතර ප්‍රාග්ධන අවශ්‍යතා
- ණය හෝ ණය වර්ධනය මත ඉහළ සීමා

මූල්‍ය පද්ධති අවදානම අවම කිරීම සඳහා සාර්ව විචක්ෂණශීලී උපකරණ දෙආකාරයකින් උපකාරී වෙයි. පළමුව, මූල්‍ය වෙළෙඳපොළේ ඇති වන අසමතුලිතතා ගොඩ නැගීම අවම කිරීම තුළින් මූල්‍ය අර්බුදයක් ඇති වීමේ ඉඩ ප්‍රස්ථා අවම කිරීම මෙන් ම, යම් හේතුවකින් මූල්‍ය අසමතුලිතතා ඇති වුවහොත් එයින් ඇති වන මූල්‍ය සහ ආර්ථික පසුබෑස්ම අවම කිරීමත් එ වැනි පසුබෑස්මක් ඇතිවීමේ වේගය අවම කිරීමත් ය. දෙවනුව, මූල්‍ය පද්ධතිය පුරාවට ම බලපාන පොදු අවදානම්, මූල්‍ය පද්ධතියේ අවදානම් ඒකරාශීවීම් සහ මූල්‍ය පද්ධතිය අවදානමට ලක් කිරීමට හේතු වන එ තුළ පවතින අන්‍යෝන්‍ය සබඳතා සහ අන්‍යෝන්‍ය රැඳියාවන් හඳුනා ගැනීමෙන් මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරකම් අඩාල වීම මග හරවා ගැනීමට උපකාරී වෙයි.

‘ස්වයංක්‍රීය නිරවද්‍යකරණ උපකරණ’ සහ ‘අභිමතික නිරවද්‍යකරණ උපකරණ’ ලෙස සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති උපකරණ පුළුල් වශයෙන් බෙදා වෙන් කළ හැකි යි. ස්වයංක්‍රීය නිරවද්‍යකරණ උපකරණ යම්කිසි නිශ්චිත සම්මතයක් මත පදනම් වෙයි. ඒවා මූල්‍ය පද්ධතියේ චක්‍රීය ප්‍රවණතා නිෂ්ඵල කරමින් අවදානම් ගොඩනැගීම වළක්වා ගැනීමට උපකාරී වෙයි. ‘ආර්ථිකයක අහිතකර කාලවල දී යොදා ගත හැකි ස්වාරක්ෂක ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වන කාලවල දී ගොඩනැගිය යුතු යි’ යන මූලධර්මය මත ස්වයංක්‍රීය නිරවද්‍යකරණ උපකරණ පදනම් වේ. අභිමතික නිරවද්‍යකරණ උපකරණ යනු මූල්‍ය පද්ධතියේ අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින් මූල්‍ය පද්ධතියේ අවදානම් හැසිරීම වෙනස් කිරීම සඳහා ආර්ථික නියෝජිතයින්ගේ තීරණවලට බලපෑම් කිරීමට අදාළ අධිකාරීන්ගේ තක්සේරු අනුව සකසන ලද උපකරණයි. ඇතැම් අවස්ථාවල දී ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතු ද නැති ද යන්න ප්‍රතිපත්ති සම්පාදකයින්ට අපැහැදිලි විය හැකි බැවින් මූල්‍ය පද්ධති ස්ථායිතාව තහවුරු කර ගැනීම සඳහා මෙම ස්වයංක්‍රීය නිරවද්‍යකරණ උපකරණ සහ අභිමතික නිරවද්‍යකරණ උපකරණ යන දෙකෙහි සංකලනයක් යොදා ගැනීම හොඳම මාර්ගය විය හැකි බවට බොහෝ පර්යේෂකයෝ තර්ක කරති. ආර්ථිකය තුළ සැලකිය යුතු වෙනස්කම් සිදු වෙමින් පවතින අවස්ථාවක, ණය ප්‍රසාරණය සිදු වන්නේ මූලික වෙනස්කම් සිදු වෙමින් පවතින නිසා ද නැතහොත් සමස්ත ඉල්ලුම අධික ලෙස ප්‍රසාරණය වීම නිසා ද යන්න තීරණය කිරීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයින් අපහසුතාවකට පත් විය හැකි වීම මෙහි දී උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.

පසුගිය වසර කිහිපය පුරා මහ බැංකුව සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ණය ප්‍රමාණය සහ සුරැකුම් වටිනාකම අතර අනුපාතය මත කාලානුකූල ඉහළ සීමා, ණය වර්ධනය මත ඉහළ සීමා, ගතික අක්‍රීය ණය මත වෙන් කිරීම් අනුපාත, කාලානුරූප ව වෙනස් වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා, කාලානුරූප ව වෙනස් වන ආන්තික අවශ්‍යතා, සංචිත අවශ්‍යතා, ශුද්ධ විවෘත විදේශ විනිමය තත්ත්ව, විදේශ විනිමය ණය මත ඉහළ සීමා සහ නිරාවරණ සීමා එයට ඇතුළත් වෙයි. මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අතුරින් කිහිපයක් මුදල් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම හරහා සිදු වූ අතර අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවූයේ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට සම්බන්ධ නියාමන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ලෙස ය. එහෙත් ඒවා මූල්‍ය පද්ධති ස්ථායිතාව සුරැකීමට උපකාරී විය.

## බැංකු, මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය

බැංකු සහ මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ තැන්පත්කරුවන්ගේ තැන්පතු ද ආයෝජකයින්ගේ ආයෝජන ද සුරක්ෂිත කරලීමේ අරමුණින් බැංකු, මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය සහ අධීක්ෂණය කිරීමේ වගකීම ද මහ බැංකුවට පැවරී ඇත.

බැංකු නියාමනය සහ අධීක්ෂණය කිරීම හසුරුවනු ලබන්නේ බැංකු පනත සහ මුදල් නීති පනත මගිනි. ශ්‍රී ලංකාවේ බැංකුවලට බලපත්‍ර නිකුත් කිරීමේ අධිකාරී බලය මහ බැංකුවට පැවරී ඇති අතර ඒ අනුව

බැංකු වර්ග දෙකක් සඳහා, එ නම්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (ඉතුරුම් සහ සංවර්ධන බැංකු) සඳහා බලපත්‍ර නිකුත් කරයි. මහජනයාගෙන් ඉල්ලුම් තැන්පතු (ජංගම ගිණුම්) බාර ගැනීමට සහ සියලු ම විදේශ විනිමය ගනුදෙනු කටයුතුවල නියැලීමට වාණිජ බැංකුවලට අවසර ලබා දී ඇත. විශේෂිත බැංකුවලට එ සේ කළ නො හැකි ය. වාණිජ බැංකු සහ විශේෂිත බැංකු අතර පවතින ප්‍රධාන වෙනස්කම මෙය වෙයි.

බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් කමිටුව මගින් විදහා දක්වන බැංකු අධීක්ෂණය සඳහා වන ජාත්‍යන්තර ව පිළිගත් සම්මතයන් මත බැංකු අධීක්ෂණය කිරීම පදනම් වී ඇත. ගෝලීය ප්‍රවණතාවලට අනුකූල වෙමින්, අවදානම මත පදනම් වූ බැංකු අධීක්ෂණ ක්‍රමයකට මහ බැංකුව ප්‍රවේශ වෙමින් සිටියි. මෙම ප්‍රවේශය බැංකුවල පවතින අවදානම් හඳුනා ගැනීම, එම අවදානම් කළමනාකරණය කිරීම සහ එම අවදානම් අවම කිරීමට බැංකුවලට ඇති හැකියාව තක්සේරු කිරීම කේන්ද්‍රීය කොට ගෙන ඇත.

නියාමන සහ අධීක්ෂණ කාර්යයන්හි කොටසක් වශයෙන්, බැංකුවලට බලපත් නිකුත් කිරීම, බැංකුවල මෙහෙයුම් කටයුතු, බැංකු වසා දැමීම, බැංකු හා සම්බන්ධ විචක්ෂණ අවශ්‍යතා, දුර්වල බැංකුවල පවතින ගැටලු නිරාකරණය කිරීම, නියාමන ක්‍රියාමාර්ග බල ගැන්වීම වැනි කටයුතු සම්බන්ධයෙන් මහ බැංකුව විධාන නිකුත් කරයි.

බැංකුවල අඛණ්ඩ ව සිදු කෙරෙන එතැන් අධීක්ෂණ සහ කලින් කලට සිදු කෙරෙන විතැන් පරීක්ෂණ, බැංකු කළමනාකරණය සමඟ පවත්වන රැස්වීම් සහ බාහිර විගණකයින් සමඟ සම්බන්ධීකරණය වැනි මූලික ක්‍රමවේද අධීක්ෂණ කටයුතු සඳහා උපයෝගී කර ගනී.

විචක්ෂණ අවශ්‍යතා සමඟ බැංකු අනුකූල වීම පිළිබඳ ව මහ බැංකුව නිරීක්ෂණය කරයි. ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, ද්‍රවශීලතාව, ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය, එක් පාර්ශ්වයකට සාපේක්ෂ වශයෙන් විශාල ණය ප්‍රමාණයක් හෝ අත්තිකාරම් ලබා දීම හේතුවෙන් බැංකුවලට ඇති අවදානම, වත්කම්වල ගුණාත්මකභාවය, අක්‍රීය ණය සඳහා වෙන්කිරීම්, සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු, ආදායම් හඳුනා ගැනීම, කොටස් හිමිකම, අයෝජන, විදේශීය ණය ගැනීම්, ගිණුම් අනාවරණය කිරීම සහ බැංකු විගණනය යනාදිය නිරීක්ෂණය කරයි. මෙයට අමතර ව, බැංකුවලට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවේද ද අගයයි. 2018 වසර අග භාගය වන විට, ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු 26ක් (දේශීය බැංකු 13ක් සහ විදේශීය බැංකු 13ක්) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7ක් ක්‍රියාත්මක ව පැවතිණි.

මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය කරනුයේ මහ බැංකුවයි. බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන නියාමන සහ අධීක්ෂණ රාමුව බැංකු සඳහා වන රාමුවට සමාන වෙයි. මහ බැංකුව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ද ලියාපදිංචි කොට නියාමනය කරයි. 2018 වසර අග වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ලියාපදිංචි විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ගණන පිළිවෙළින් 43ක් සහ 5ක් විය.

දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත යටතේ පත් කරන ලද රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් ද මහ බැංකුව නියාමනය සහ අධීක්ෂණය කරයි. 2018 වසරේ අග වන විට, ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු 7ක් සහ තනි සමාගම් 8ක් ක්‍රියාත්මක විය.

තව ද, ක්ෂුද්‍ර මූල්‍ය කටයුතුවල නියැලී සිටින ආයතන නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ අරමුණින් බල ගන්වන ලද ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ එම ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ ද මහ බැංකුව නියැලී සිටියි.

## පියවීමේ පහසුකම් සැපයීම සහ ගෙවීම් පද්ධතිය නියාමනය

මනා ලෙස ක්‍රියා කරන සුරක්ෂිත ගෙවීම් සහ පියවීම් පද්ධතියක් පැවතීම ස්ථායී මූල්‍ය පද්ධතියක් සඳහා අත්‍යවශ්‍ය ම අංගයකි. 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනතට අනුව ගෙවීම්, නිෂ්කාශන සහ පියවීම් පද්ධති නියාමනය සහ අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ඇත. මෙයට අමතර ව, ජාතික ගෙවීම් පද්ධතිය සැලසුම් කිරීමේ සහ ගෙවීම්, නිෂ්කාශන හා පියවීම් පද්ධති පිහිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා නායකත්වය ලබා දීමේ වගකීම ද මහ බැංකුව දරයි. තව ද, ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතියේ වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ගෙවීම් පද්ධතියේ සිටින ප්‍රධාන පාර්ශ්වයන්ගෙන් සමන්විත ජාතික ගෙවීම් කවුන්සිලය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලදී.

පද්ධතිමය වශයෙන් වැදගත් වන ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතියක් වන ලංකාසෙට්ල් පද්ධතිය ක්‍රියාත්මක කරන්නේ ද මහ බැංකුවයි. ලංකාසෙට්ල් පද්ධතියට පද්ධති දෙකක් ඇතුළත් වේ. ඒ තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතියයි. තත්කාලීන දළ පියවීම් පද්ධතිය යනු පද්ධති අවදානම ඉවත් කරමින් තත්කාලීන ව විශාල වටිනාකම් ඇති ඉතා ඉක්මණින් පිය විය යුතු තීරණාත්මක ගෙවීම් පියවීම සඳහා පහසුකම් සලසන ලංකාසෙට්ල් පද්ධතියේ අරමුදල් පියවීම් කරනු ලබන සංරචකයකි. තත් කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවනු ලබන ප්‍රධාන වර්ගයේ ගනුදෙනු වන්නේ අන්තර් බැංකු ඒක්ෂණ වෙළෙඳපොළ ගනුදෙනු, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ගනුදෙනු, විවට වෙළෙඳපොළ කටයුතු හා සම්බන්ධ ගනුදෙනු සහ නිෂ්කාශනාගාර ගනුදෙනුයි. ලංකාසෙක්‍යු යනු රජයේ සුරැකුම්පත් සඳහා වන නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු ක්‍රමය අඩංගු සුරැකුම්පත් පියවීමේ සංරචකයකි. ලංකාසෙට්ල් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා එම පද්ධතිය හා සහභාගීවන්නනන්ට ගෙවීමකින් තොර ව ඇපකර පදනමක් මත දෛනික ද්‍රවශීලතා පහසුකම් මහ බැංකුව සපයයි.

මහ බැංකුව සහ වාණිජ බැංකු හිමිකාරිත්වය දරන ජාතික නිෂ්කාශනාගාරය වන ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන සුළු පරිමාණ ගෙවීම් සහ නිෂ්කාශන පද්ධති සඳහා පියවීමේ පහසුකම් නියාමනය කොට සපයනු ලබන්නේ ද මහ බැංකුවයි. සුළු පරිමාණ ගෙවීම් සහ නිෂ්කාශන පද්ධති වන්නේ (i) ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (ii) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (iii) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, (iv) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය යන ඒවාය. ගෙවුම් කාඩ්පත්, ජංගම දුරකතන මගින් ගෙවීම් සහ QR කේතය පදනම් කර ගත් ගෙවීම් වැනි විද්‍යුත් ක්‍රමයට ගෙවීම් සිදු කළ හැකි උපකරණ ජනප්‍රියවීමත් සමඟ ම, එ වැනි උපකරණ හරහා කරනු ලබන ගෙවීම්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීමට මහ බැංකුව මාර්ගෝපදේශ හඳුන්වා දුන්නේ ය.

## මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම වටිනාකමකින් යුතු ගෙවීමක් කිරීම සඳහා වලංගු මුදල් වන මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමට මහ බැංකුවට පරම අයිතිය ඇත. ව්‍යවහාර මුදල් නිකුත් කිරීමට උපරිම සීමාවක් පනවා නැත. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පදනම් වන්නේ මුදලේ ගනුදෙනු ඉල්ලුමයි.

නිකුත් කරන නෝට්ටු හා කාසිවල අගය, පරිමාණය සහ නෝට්ටු නිර්මාණය කිරීම ආදිය මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. දැනට මුදල් නෝට්ටු වර්ග නවයක් (රුපියල් 5000, 2000, 1000, 500, 200, 100, 50, 20 හා 10) සහ කාසි වර්ග දහයක් (රුපියල් 10, 5, 2 හා 1, ශත 50, 25, 10, 5, 2 හා 1) මහ බැංකුව සංසරණය සඳහා නිකුත් කර ඇත. ව්‍යාජ මුදල් නිර්මාණය වැළැක්වීම සඳහා විශාල වටිනාකමක් ඇති මුදල් නෝට්ටු වර්ගවල ආරක්ෂිත සලකුණු වැඩිදියුණු කොට ඇත. සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පිරිසිදු නෝට්ටු භාවිතය පිළිබඳ හඳුන්වාදීමක් ක්‍රියාත්මක වෙමින් පවතියි. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇති ව සමරු නෝට්ටු සහ කාසි ද මහ බැංකුව නිකුත් කරයි.

## රජයේ බැංකුකරු සහ මූල්‍ය උපදේශක

මහ බැංකුව රජයේ බැංකුකරු ලෙස රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන, රජයේ ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වා ගෙන යමින් ඒවාට බැංකු පහසුකම් සපයයි. මහ බැංකුව රජයට තාවකාලික අත්තිකාරම් ද ලබා දෙයි.

මහ බැංකුවේ ප්‍රතිපත්ති සමග රජයේ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය කිරීමේ අරමුණින් ක්‍රියාවට නැංවිය යුතු ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පිළිබඳ ව රජයේ මූල්‍ය උපදේශක ලෙස මහ බැංකුවට තම නිර්දේශ රජයට

ඉදිරිපත් කළ හැකි ය. තව ද, ශ්‍රී ලංකාවේ මුදල් තත්ත්වය සහ මහ බැංකුව පවත්වාගෙන යන මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ ව මෙන් ම මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි දැනට පවත්වාගෙන යන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය බලපාන ආකාරය විමර්ශනය කරමින් සකස් කරන ලද විස්තරාත්මක විග්‍රහයක් ඇතුළත් රහසිගත වාර්තාවක් අය වැය කතාව සූදානම් කිරීමේ දී භාවිත කිරීම සඳහා සෑම වසරක ම සැප්තැම්බර් 15 වැනි දින වන විට මහ බැංකුව මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය.

## වාණිජ බැංකුවල බැංකුකරු

වාණිජ බැංකුවල බැංකුකරු ලෙස මහ බැංකුව වාණිජ බැංකුවලට ජංගම ගිණුම් පහසුකම් සපයන අතර එම ගිණුම් අතර ගෙවීම් පියවීම ද සිදු කරයි. වාණිජ බැංකුවලට පියවීම් පහසුකම් සපයන බැවින් ඒ අනුව මහ බැංකුව විසින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය, ශ්‍රී ලංකා අන්තර් බැංකු පියවීම් පද්ධතිය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය වැනි ප්‍රධාන ගෙවීම් හා පියවීම් පද්ධතිවලට අදාළ වාණිජ බැංකු අතර ශුද්ධ පියවීම් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙම මෙහෙයුම් දේශීය මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාවට දායක වෙයි.

මුදල් හෝ බැංකු ස්ථායිතාවට සෘජු තර්ජනයක් වන මූල්‍ය භීතිකා හදිසියේ සිදු වූ හෝ හදිසියේ සිදු විය හැකි අවස්ථාවල දී, තාවකාලික ද්‍රවශීලතා ප්‍රශ්නවලට මුහුණ දෙන වාණිජ බැංකුවලට මහ බැංකුව පිළිගත් ඇපකර යටතේ හදිසි ණය පහසුකම් ද සපයයි. සාමාන්‍යයෙන් මෙම පහසුකම "අවසාන ණය දෙන්නා" යනුවෙන් හැඳින්වෙයි.

## රාජ්‍ය ණය කළමනාකරණය සහ රාජ්‍ය මූල්‍ය නියෝජිත

මුදල් නීති පනතේ 113 වන වගන්තියට අනුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා රාජ්‍ය මූල්‍ය නියෝජිත ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වගකීම් දරයි. රාජ්‍ය ණය දිගින් දිගට ම රටට උසුලා ගත හැකි මට්ටමක පවත්වා ගෙන යෑම සඳහා රාජ්‍ය ණය කළමනාකරණය විචක්ෂණශීලී ව කෙරෙයි. එහි අරමුණ වන්නේ රජයේ මූල්‍යකරණ අවශ්‍යතා මෙන් ම රජය විසින් කළ යුතු ගෙවීම් ද කලට වේලාවට අඩු ම වියදමකින් හා මැදි කාලීන ව හා දිගු කාලීන ව පවතින අවදානම විචක්ෂණශීලී ව අඩු ම මට්ටමක පවත්වා ගැනීමෙන් ණයෙහි තිරසරබව සහතික කිරීමයි.

කෙටි කාලීන කල්පිරීම්වලින් සමන්විත භාණ්ඩාගාර බිල්පත් සහ මැදි හා දිගු කාලීන කල්පිරීම්වලින් සමන්විත භාණ්ඩාගාර බැඳුම්කර වැනි රජයේ සුරැකුම්පත් ප්‍රසිද්ධ වෙන්දේසි හරහා නිකුත් කිරීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් අරමුදල් රැස් කරයි. රාජ්‍ය ණය සුරැකුම්පත්වල කල් පිරීමේ කාල සීමාව ඇතුළු

අනෙකුත් රජයේ දේශීය ණය ලබා ගැනීම් තීරණය කරනු ලබන්නේ නිරන්තරයෙන් හමු වන මහ බැංකු හා භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සැදුම් ලත් දේශීය ණය කළමනාකරණ කමිටුව මගිනි. දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන අතර ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරයි. රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් හරහා භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට නිතිපතා මහ බැංකුව විසින් වෙන්දේසි සිදු කරනු ලබයි.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිර්ලේඛිත ව රජයේ ණය සුරැකුම්පත් ලේඛනගත කරන මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS - Central Depositary System) සටහන් වෙයි. මධ්‍යම තැන්පතු පද්ධතිය යනු ලංකාසෙක්‍යු පද්ධතියේ ම සංරචකයකි. තව ද, මහ බැංකුව රජය වෙනුවෙන් දේශීය වෙළෙඳපොළේ එක්සත් ජනපද ඩොලර්වලින් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කරයි. කැබිනට් මණ්ඩලය විසින් පත් කරනු ලැබූ මෙහෙයුම් කමිටුව කරන ලද නිර්දේශවලට අනුව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළේ මැදි/දිගු කාලීන ස්ථාවර අනුපාතිකයක් ඇති ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමෙන් ද අරමුදල් රැස් කරයි. අනුමත කළ අයවැය සීමා හා අදාළ නීති යටතේ හඳුනා ගත් අනෙකුත් නීතිමය ප්‍රතිපාදන තුළ ශ්‍රී ලංකා රජය විසින් ලබා ගන්නා ලද සියලු ම ණය පවතින අතර ඒවා සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පූර්ණ අනුමැතිය ලැබිය යුතු ය.

මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය විසින් සාමූහික ව සකසා ක්‍රියාත්මක කරන මැදි කාලීන ණය කළමනාකරණ උපක්‍රමය මගින් නිශ්චය කෙරෙන පරාමිති තුළ පවතින ලෙස ණය ලබා ගැනීම සිදු කරයි. ශ්‍රී ලංකා රජයේ ණය තොගයේ වගකීම් විචක්ෂණශීලී ව පාලනය කිරීමේ කටයුතුවල ද මහ බැංකුව නිරත වේ. ඒ විශේෂයෙන් ම ණය ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීම සඳහා 2018 අංක 8 දරන සක්‍රිය වගකීම් කළමනාකරණ පනත යටතේ හඳුනා ගත් ලෙසට අදාළ ප්‍රතිපාදන හරහා ය.

## සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය සහ එහි භාරකරු ලෙස ක්‍රියා කිරීම

ශ්‍රී ලංකාවේ විශාල ම විශ්‍රාමික අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබී ය. සේවක අර්ථසාධක අරමුදල් පනතේ ප්‍රතිපාදනවලට අනුව, අරමුදලේ භාරකරු ලෙස අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත්තේ සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මුදල් මණ්ඩලය වෙත පවරන ලද කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමටයි.

## විදේශ විනිමය කළමනාකරණය

ආයෝජකයින් තුළ විශ්වාසය වර්ධනය කිරීම, විදේශ සංචිත ශක්තිමත් කිරීම සහ විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථායී කිරීමේ අරමුණින් 1953 අංක 24 දරන විනිමය පාලන පනත අවලංගු කොට 2017 අංක 12 දරන විදේශ විනිමය පනත 2017.11.20 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරන ලදි. එම පනතට අනුව, විදේශ විනිමය ගනුදෙනු ප්‍රවර්ධනය කිරීමේ දී හා නියාමනය කිරීමේ දී රජයේ නියෝජිත ලෙස මහ බැංකුව අදාළ රාජකාරි හා කාර්යයන් ඉටු කරයි.

මේ අනුව ප්‍රධාන කාර්යයන් වන්නේ විදේශ විනිමය හා අදාළ ගනුදෙනු, ව්‍යවහාර මුදල්, එනම් ශ්‍රී ලංකා රුපියල් හා විදේශීය මුදල් ආනයනය/අපනයනය කිරීම, සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි යොදා ගැනීම හරහා විදේශීය මුදල් සන්තක කර ගැනීම, විදේශ විනිමය ගනුදෙනු නිරීක්ෂණය කිරීම මෙන් ම පනතේ ප්‍රතිපාදන හා ඒ යටතේ නිකුත් කරන ලද නියාමන/නියෝගවලට අනුකූල කරවීමට කටයුතු කිරීමයි.

වර්තමානයේ දී, අදාළ ගනුදෙනුවල අව්‍යාජ බව තහවුරු කර ගැනීමේ වගකීමට යටත් ව ජංගම ගිණුම යටතට එන භාණ්ඩ හා සේවා වෙළෙඳාම්වලට අදාළ වන විදේශ විනිමය ගනුදෙනු, විදේශ විනිමය ගනුදෙනු සඳහා බලය ලත් වෙළෙඳුන් (බලය ලත් වාණිජ බැංකු හරහා) නිදහසේ කිරීමට පූර්ණ අවසරයක් ලබා දී ඇත. මූර්ත හෝ මූල්‍ය වත්කම් (එ නම් ප්‍රාග්ධන ගිණුම හා සම්බන්ධ ගනුදෙනු) අත්පත් කර ගැනීම සම්බන්ධ ප්‍රාග්ධන ගනුදෙනු යම්තාක් දුරට ලිහිල්කරණය කර ඇත. අවසර ලබා දී ඇති බොහෝ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් මහ බැංකුවේ අනුමැතිය නොමැති ව බලය ලත් වෙළෙඳුන් හරහා කටයුතු කර ගෙන යෑමට අවකාශ සලසා ඇත.

ගෝලීය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තියට අනුව තවදුරටත් විදේශ විනිමය ගනුදෙනු විශේෂයෙන් ම ජංගම ගිණුම හා සම්බන්ධ ගනුදෙනු ලිහිල්කරණය කිරීමට පියවර ගනිමින් සිටියි.

## මූල්‍ය අන්තර්ගතභාවය සහ තුලිත වර්ධනය උදෙසා කටයුතු කිරීම

රටේ ආර්ථික වර්ධනය තුලිත බවින් සහ අන්තර්ගතභාවය සහිත ව සිදු වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් නියෝජිත කාර්ය භාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවිධ ප්‍රතිමූල්‍යකරණ, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබයි. ණය හා සම්බන්ධ අනුපූරක සේවාවන් ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාජයේ අවශ්‍ය කොටස් වෙත සපයයි. මෙම සහනදායී ණය යෝජනා ක්‍රම සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සඳහා අරමුදල් සපයනු ලබන්නේ මහ බැංකුව, රජය, ණය ලබා දෙන ආයතන හා සහභාගීත්ව මූල්‍ය ආයතනයි.

ඉහත සඳහන් යෝජනා ක්‍රම හරහා දරා ගත හැකි මූල්‍ය පහසුකම් සැපයීමෙන් කෘෂිකාර්මික හා පශු පාලන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය ව්‍යවසායන් හා ක්ෂුද්‍ර මූල්‍ය අංශ ද ඇතුළත් තනි හා සමූහ ව්‍යාපාරවලට මහ බැංකුව සේවා සපයයි.

මෙයට අමතර ව නිපුණතා සංවර්ධනය, මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය, ව්‍යවසාය සංවර්ධනය හා පසු අස්වනු තාක්ෂණය සංවර්ධනය පිළිබඳ වැඩසටහන් ද මෙහෙයවනු ලබයි.

ප්‍රතිපත්තිමය පැත්තෙන් බලන විට, මූල්‍ය සේවාවන් ලබා ගැනීමට අපහසු ග්‍රාමීය ප්‍රජාවන් අතර ඇති ණයගැතිභාවයට විසඳුම් ලබා දීමේ අරමුණින් රටේ මූල්‍ය අන්තර්භාවය වර්ධනය කිරීම සඳහා මහ බැංකුව කටයුතු කරයි. මෙම ප්‍රයත්නයේ දී, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ජාතික මූල්‍ය උපාය මාර්ගය සැකසීමේ වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවා ඇත. එයින් බලාපොරොත්තු වන්නේ බෙදුණු ප්‍රවේශයන් වෙනුවට රටේ මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීම සඳහා සියලු ම පාර්ශ්වකරුවන් එක ම දිශාවකට යොමු කිරීමයි.

## මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම වැළැක්වීම, හඳුනා ගැනීම, පරීක්ෂා කිරීම හා නීතිය හමුවට ගෙන ඒම සඳහා මූල්‍ය බුද්ධි සේවා සැපයීම

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුව තුළ ජාතික කේන්ද්‍රස්ථානයයි. 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවා ඇත. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සඳහන් අරමුණු හා බලතලවලට අනුව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සැක සහිත ගනුදෙනු පිළිබඳ වාර්තා සහ පනවන ලද සීමාවන් පදනම් කර ගත් වාර්තා බාර ගනියි. නීති බල ගැන්වීමේ ආයතනවලට සහ අධීක්ෂණ ආයතන ද ඇතුළු ව අනෙකුත් නියෝජිත ආයතනවලට සැක සහිත ගනුදෙනු පිළිබඳ වාර්තා හරහා එක්රැස් කළ මෙන් ම ලබා ගත් තොරතුරු විමර්ශනය කිරීම, තක්සේරු කිරීම හා ව්‍යාප්ත කිරීම සිදු කරන්නේ මූල්‍ය බුද්ධි ඒකකයයි. ඒ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට, අනාවරණය කිරීමට, විමර්ශනය කිරීමට සහ වැරදිවලට දඬුවම් පැමිණ වීමට දායක වෙමිනි. මීට අමතර ව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය හා නියාමන කාර්යයන් කරන අතර එ සේ අධීක්ෂණය හා නියාමනය කරන්නේ ඒ වෙත වාර්තා කරන ආයතන යි. එ නම් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සඳහන් ලෙසට මූල්‍ය ව්‍යාපාර සහ නම් කළ මූල්‍ය නො වන ව්‍යාපාරවල නිරත වී සිටින ආයතන යි.

# 5. සංවිධානය

## කමිටු

මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්ට සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී මහ බැංකුවේ පහත සඳහන් කමිටු විශේෂ කාර්ය භාරයක් ඉටු කරයි. සෑම කමිටුවක ම සභාපතිත්වය ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා හෝ නියෝජ්‍ය අධිපතිවරයකු හෝ සහකාර අධිපතිවරයකු දරයි.

- මුදල් ප්‍රතිපත්ති කමිටුව
- විදේශීය සංචිත කළමනාකරණ කමිටුව
- වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව
- මූල්‍ය නො වන අවදානම් කළමනාකරණ කමිටුව
- ජාතික ගෙවීම් කවුන්සිලය
- මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව
- සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන කමිටුව
- භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ටෙන්ඩර් මණ්ඩලය

බැංකුවේ පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන්නේ අධිපති සභාපතිත්වය දරන ආයතනික කළමනාකරණ කමිටුව මගිනි. අධිපති පුහුණු කමිටුවේ ද සභාපතිත්වය දරයි.

## දෙපාර්තමේන්තු

මහ බැංකුවේ බොහෝ දෙපාර්තමේන්තු ඒවාට අයත් කාර්ය භාරයන් ට අනුව පර්ෂද තුනකට බෙදා ඇත. 'ආර්ථික ප්‍රතිපත්ති උපදේශනය', 'මූල්‍ය අංශ නියාමනය හා අධීක්ෂණය' හා 'ශක්‍යතා වර්ධනය හා සහය සේවා සැපයීම' එම පර්ෂදයි. සෑම පර්ෂදයක් ම ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය අධිපතිවරයා හෝ නියෝජ්‍ය අධිපතිවරයකු විසින් අධීක්ෂණය කෙරෙයි. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව හා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව මෙම පර්ෂද තුනට අයත් නො වන අතර සහකාර අධිපතිවරයකු හරහා

අධිපතිට සෘජු ව ම වාර්තා කරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව හරහා මුදල් මණ්ඩලයට සෘජු ව ම වාර්තා කරන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල උපදේශක විගණන කමිටුව හරහා මුදල් මණ්ඩලයට සෘජු ව ම වාර්තා කරයි. අනුකූලතා කාර්යයන් සම්බන්ධයෙන් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාවට වාර්තා කරයි.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු

| දෙපාර්තමේන්තුව | ප්‍රධාන කාර්යයන්/වගකීම් |
|---|---|
| බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව | බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කරනු පිණිස බැංකු නියාමනය සහ අධීක්ෂණය කිරීම |
| බැංකු විදු පියෙස | මූල්‍ය අංශයේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම සහ විශේෂයෙන් ම මහ බැංකු කාර්යය මණ්ඩලයේ හා අනෙකුත් මූල්‍ය අංශයට අයත් සේවකයින්ගේ තාක්ෂණික නිපුණතාව ශක්තිමත් කිරීම |
| සන්නිවේදන දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ අරමුණු වන ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව, සහ මහ බැංකුව විසින් කරනු ලබන නියෝජිත කාර්යයන් (විදේශ විනිමය දෙපාර්තමේන්තුව, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබන නියෝජිත කාර්යයන්) සම්බන්ධයෙන් ගත් ප්‍රතිපත්ති තීරණ හා නියාමන මෙන් ම මහ බැංකුවේ මෙම වගකීම්වලට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීම |
| ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම වටිනාකමක් ගත් ගෙවීමක් කිරීම සඳහා වලංගු මුදල් වන මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීමට මහ බැංකුවට ඇති පරම අයිතිය ක්‍රියාත්මක කිරීම |
| බැංකු නො වන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හා බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීම සහ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම |

| දෙපාර්තමේන්තුව | ප්‍රධාන කාර්යයන්/වගකීම් |
|---|---|
| දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව | ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳපොළ කටයුතු මෙහෙයවීම හා වාණිජ බැංකු සඳහා සංචිත අවශ්‍යතා බලගැන්වීම තුළින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.<br><br>රජය, වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ජංගම ගිණුම් පහසුකම් සැපයීම සහ රජයේ බැංකුව සහ වාණිජ බැංකුවල බැංකුව ලෙස ක්‍රියා කිරීම.<br><br>මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී මුදල් වෙළෙඳපොළ මිල ගණන් අනාවරණය වීම ධෛර්යමත් කිරීම උදෙසා බලය ලත් මුදල් තැරැව්කරුවන් නියාමනය හා අධීක්ෂණය කිරීම |
| ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව | මිල හා ආර්ථික ස්ථායිතාව පවත්වා ගෙන යෑම සඳහා මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමට අධිපතිතුමාට හා මුදල් මණ්ඩලයට ස්වාධීන ව හා කාලීන ව උපදෙස් දීම හා ඊට අවශ්‍ය දත්ත සම්පාදනය, ප්‍රතිපත්ති විශ්ලේෂණය හා විද්‍යාත්මක පර්යේෂණ කිරීම.<br><br>මහජනතාවට සාර්ව ආර්ථික දත්ත හා තොරතුරු සැපයීම සඳහා ව්‍යවස්ථාපිත වගකීම දැරීම |
| සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව | සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ගේ දායකත්ව මුදල් හා අධිභාර එකතු කිරීම, සාමාජික ගිණුම් හා අරමුදලේ ගිණුම් පවත්වා ගෙන යෑම, අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම, සාමාජික ගිණුම්වලට පොලී බැර කිරීම, ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ගෙවීම සහ අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම. |
| පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරන ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම, සහ බැංකුවේ මෙහෙයුම් කටයුතු ඵලදායී ලෙස පවත්වා ගෙන යැමට හැකි වන පරිදි පහසුකම් සහ සේවා සැපයීම. |
| මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව | ගිණුම්කරණය සහ මූල්‍ය වාර්තාකරණය, මහ බැංකුවේ අයවැය පාලනය, පොදු සේවා සඳහා ගෙවීම් සහ සේවක වේතන ගෙවීම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර මුදල් කළමනාකරණය සහ රජය වෙනුවෙන් විදේශීය ණය මුදා හැරීම හා ආපසු ගෙවීම. |

| දෙපාර්තමේන්තුව | ප්‍රධාන කාර්යයන්/වගකීම් |
|---|---|
| විදේශ විනිමය දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු මනා ව ප්‍රවර්ධනය වනු පිණිස විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම. |
| මානව සම්පත් දෙපාර්තමේන්තුව | කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම්, අනුයුක්ත කිරීම්, උසස් කිරීම් සහ කාර්යසාධනය නිරීක්ෂණය හා ඇගැයීම. |
| තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව | තොරතුරු තාක්ෂණය මගින් විසඳුම් සැපයීමෙන් මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු වඩාත් පහසු ලෙස හා කාර්යක්ෂම ව සිදු කර ගෙන යෑමට සහය වීම. |
| අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම. |
| ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව | නිල විදේශීය සංචිත කළමනාකරණය කිරීම |
| නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ ක්‍රියාකාරකම් පාලනය කරන නෛතික හා නියාමන රාමුවේ ශක්තිමත්බව හා සමකාලීනබව තහවුරු කිරීම සහ මහ බැංකුව නීතිමය වශයෙන් සුරක්ෂිත කිරීම.<br>මහ බැංකුව තුළ රාජකාරිය ඉටු කිරීමේ දී වගකීමෙන් එලදායී අනුකූලතාවක් ඇති ව එය සිදු කරනු පිණිස කටයුතු කිරීම. |
| සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව | දේශීය මූල්‍ය පද්ධතියේ පවතින පද්ධති අවදානම් තක්සේරු කිරීම සහ දේශීය මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව අත් පත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම. |
| ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව | ජාතික ගෙවීම් පද්ධතියේ මනා ක්‍රියාකාරිත්වය හා සුරක්ෂිතතාව තහවුරු කරනු පිණිස ගෙවීම්, නිෂ්කාශණ හා පියවීම් පද්ධති නියාමනය හා අධීක්ෂණය කිරීම සහ ගෙවීම්, නිෂ්කාශණ හා පියවීම් පද්ධති වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ හා නායකත්වය සැපයීම. |
| ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම සකස් කිරීම සහ උපාය මාර්ගික සැලසුමට අනුව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. |

| දෙපාර්තමේන්තුව | ප්‍රධාන කාර්යයන්/වගකීම් |
|---|---|
| රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව | වාර්ෂික ව සම්මත වන විසර්ජන පනතට අනුව රජයේ දළ ණය අවශ්‍යතාවට ළඟා වීමට අරමුදල් ගොඩ නැගීම, මුදල් අමාත්‍යාංශය සමග මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සැකසීම, රජයේ ණය සේවාකරණ ගෙවීම් නියමිත වේලාවට සිදු කිරීම, රජයේ සුරැකුම්පත් පියවීම් මනා ලෙස සිදු කරනු පිණිස ලංකා සෙක්‍යු පද්ධතිය පවත්වා ගෙන යෑම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (Central Depositary System) ඇති රජයේ සුරැකුම්පත් ලේඛනය පවත්වා ගෙන යෑම. |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව | මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව තුළ තුලිත ආර්ථික වර්ධනයක් සඳහා සහය වීම. |
| ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලින් කෙරෙන කටයුතු අධීක්ෂණය. |
| නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව | බැංකු සහ මුදල් සමාගම් නිරාකරණ කටයුතු හා සම්බන්ධ කාර්යයන් සිදු කිරීම, අනවසර මූල්‍ය ව්‍යාපාර හා තහනම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් බලගැන්වීමේ ක්‍රියාමාර්ග ගැනීම, සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණය හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය හා සම්බන්ධ කාර්යයන් සිදු කිරීම. |
| අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ අවදානම් කළමනාකරණය හා පාලනය ශක්තිමත් කිරීම. |
| ලේකම් දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ ආයතනික පරිපාලනය - මේ අනුව ප්‍රසම්පාදන කළමනාකරණය, අපහරණ කළමනාකරණය, නිවාඩු රීති කළමණාකරණය, මහ බැංකු උත්සව සංවිධානය සහ විශ්‍රාමික අරමුදල් පරිපාලනය යනාදී කටයුතු සිදු කරයි. |
| ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මහ බැංකු පරිශ්‍රය තුළ හා මුදල් තොග ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සලසයි. |

| දෙපාර්තමේන්තුව | ප්‍රධාන කාර්යයන්/වගකීම් |
|---|---|
| කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව | කාර්ය මණ්ඩලයට සුබසාධන පහසුකම් සැපයීම |
| සංඛ්‍යාන දෙපාර්තමේන්තුව | සමාජ ආර්ථික සංඛ්‍යාන සම්පාදනය, විශ්ලේෂණය හා පුරෝකථනය කිරීම සහ සමීක්ෂණ මෙහෙයවීම. |
| පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව | මහ බැංකුවේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම |

| | |
|---|---|
| මූල්‍ය බුද්ධි ඒකකය | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අර්ථ දක්වා ඇති පරිදි මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම සහ වෙනත් ඒ හා සම්බන්ධිත නීත්‍යනුකූල නො වන ක්‍රියාකාරකම්වලට අදාළ සම්බන්ධතා අනාවරණය කර ගැනීමේ අරමුණින් මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා ලබා ගැනීම.<br><br>ඉහත සඳහන් නීත්‍යනුකූල නො වන මුදල් ගනුදෙනු හා සම්බන්ධ සැක කටයුතු මුදල් ගනුදෙනු විශ්ලේෂණය කිරීම සහ එම විශ්ලේශණවල තොරතුරු අදාළ නීති බලගැන්වීමේ හා නියාමන අධිකාරීන්ට විමර්ශණය කිරීම සඳහා මුදා හැරීම. |

## 6. මහජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන පුවත්පත් නිවේදන

- විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය
- රජයේ සුරැකුම්පත්
- උද්ධමනය
- මුදල් ප්‍රතිපත්ති විවරණය
- විවට වෙළෙඳපොළ කටයුතු
- ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය

## 7. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රකාශන

- වාර්ෂික වාර්තාව
- මූල්‍ය පද්ධති ස්ථායිතා විවරණය
- මෑත කාලීන ආර්ථික ප්‍රවණතා
- මාසික විවරණිකාව
- ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික සංඛ්‍යාන
- ගෙවීම් සංග්‍රහය
- මාණ්ඩලික පත්‍රිකා

- සටහන
- නිව්ස් සර්වේ (ඉංග්‍රීසි භාෂාවෙන් පළවන ආර්ථික විද්‍යා මාසිකය)
- වයිප්පහම් (දෙමළ භාෂාවෙන් පළවන ආර්ථික විද්‍යා මාසිකය)
- ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත
- 60 වැනි සංවත්සර සැමරුම් ප්‍රකාශනය
- 40 වැනි සංවත්සර සැමරුම් ප්‍රකාශනය
- 1950 - 1975 සැමරුම් ප්‍රකාශනය
- ජාත්‍යන්තර පර්යේෂණ සමුළු වාර්තා

# 8. ප්‍රාදේශීය කාර්යාල

## ප්‍රාදේශීය කාර්යාල මගින් ආවරණය කෙරෙන දිස්ත්‍රික්ක

**මාතර ප්‍රාදේශීය කාර්යාලය -** ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්ක

**අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය -** අනුරාධපුරය, පොළොන්නරුව, පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක

**මාතලේ ප්‍රාදේශීය කාර්යාලය -** මහනුවර, මාතලේ සහ කෑගල්ල දිස්ත්‍රික්ක

**ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය -** ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක

**කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලය -** කිලිනොච්චිය, වවුනියාව, යාපනය, මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්ක

**නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය -** නුවරඑළිය, මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක

ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් බස්නාහිර පළාතේ කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක ආවරණය කරනු ලබයි.

## ප්‍රාදේශීය කාර්යාලවල ඇමතුම් විස්තර

### අනුරාධපුරය

341, 1 පියවර, අනුරාධපුරය

දුරකතනය: 025 2222024

ෆැක්ස්: 025 0005689

විද්‍යුත් තැපෑල: roapura@cbsl.lk

### කිලිනොච්චිය

අරිවියල් නගර්, කිලිනොච්චිය

දුරකතනය: 021 2285912

ෆැක්ස්: 021 2285911

විද්‍යුත් තැපෑල:rokn@cbsl.lk

### මාතලේ

805, ත්‍රිකුණාමල වීදිය, මන්දණ්ඩාවල, මාතලේ

දුරකතනය: 066 2222167

ෆැක්ස්: 066 2222175

විද්‍යුත් තැපෑල:romatale@cbsl.lk

### මාතර

35, අනගාරික ධර්මපාල මාවත, මාතර

දුරකතනය: 066 2222167

ෆැක්ස්: 066 2222175

විද්‍යුත් තැපෑල:romatara@cbsl.lk

### නුවරඑළිය

84, බදුල්ල පාර, නුවරඑළිය

දුරකතනය: 052 3059002

ෆැක්ස්: 052 2224294

විද්‍යුත් තැපෑල: ronuwaraeliya@cbsl.lk

### ත්‍රිකුණාමලය

103, තැපැල් කාර්යාල පාර, ත්‍රිකුණාමලය

දුරකතනය: 026 2226966

ෆැක්ස්: 026 2226967

විද්‍යුත් තැපෑල: rotrinco@cbsl.lk



ISBN 978-955-575-384-5

රු. 100.00

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන තැන පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී